# ලුමිණි බබා සහ ආච්චී



අනුකි සෙනායා ඒකනායක

3 A

කෘතියේ නම: ලුමිණි බබා සහ ආච්චි

කතෘගේ නම: අනුකි සෙනායා ඒකනායක

කතෘගේ වෙනත් කෘති :

- හිතුවක්කාර කුරුලු පැටියා
- ආඩම්බර රෝස මල
- මා සමඟ ගස් වැල්
- මල්ලී පුදුම වෙලා

කෘතිය පළකරන දිනය: 15.11.2023

ISBN අංකය: 978-624-206-710-0

# පිදුම

මා ඇති දැඩි කරමින් පාසල් යවන මගේ ආදරණීය
අම්මාටත්, අප්පච්චීටත්....

මට අකුරු කියාදෙන ආදරණීය ගුරු
දෙමාපියන්ටත් ....

හොඳ දේ කියා දෙමින් මා ආදරයෙන් රැක බලා
ගන්නා ආච්චීටත්, අත්තම්මාටත්, අත්තාටත්,
දිව්‍යලෝකයේ සිටින සීයාටත් ....

දඟ වැඩ කළත්, රණ්ඩු කළත් මට ආදරේ මගේ
පුංචි මල්ලීටත් ....

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01



එක දවසක් ලුමිණි බබාගෙ ආච්චි

කිව්වා ඉස්කෝලෙට සෙල්ලම් බඩු

ගෙනියන්න එපා කියලා.



ඒත් ලුමිණි බබා ආච්චි කියපු දේ

ඇහුවෙ නෑ. එයා ඉස්කෝලෙට

සෙල්ලම් බඩු අරන් ගියා.


2 1 3 4 5
2+2
3+2

ලුම්ණි සෙල්ලම් බඩු ගෙනල්ලා

තියෙනවා ගුරුතුමී දැක්කා.

ගණං හදලත් නෑ.

දඬුවමක් විදියට පැයක්

පන්තියෙන් එළියේ

ඉන්න කිව්වා.



ලුමිණිට ලැජ්ජා හිතුණා.

දුකත් හිතුණා.



ගෙදර ගියාට පස්සෙ ආච්චි ඇහුවා

“ඇයි ඔයා දුකින් ඉන්නෙ ?” කියලා.

ලුම්ණි ආච්චිට විස්තරේ කිව්වා.



“බබා ආය කවදාවත් ඉස්කෝලෙට

සෙල්ලම් බඩු ගෙනියන්න එපා ”

ඔළුව අතගාලා ආච්චි කිව්වා.



ලුමිණි ඊළඟ දවසේ ඉස්කෝලෙට

සෙල්ලම් බඩු අරන් ගියේ නෑ.




එදා වැඩියෙන් ම ලකුණු ලැබුනෙ එයාට.

ලුම්ණිට ගොඩක් සතුටු හිතුණා.




ගෙදර ගියාට පස්සෙ එයා ආච්චිටත්

ලකුණු පෙන්නුවා.

ආච්චිටත් හරිම සතුටුයි.

ඒ වාරෙ විභාගෙනුත් වැඩි ම ලකුණු

ලැබුණා.



ඒ වෙනුවට ගුරුතුමී තෑග්ගක් දුන්නා.

තෑග්ග මොකක්ද දන්නව ද ?

ලස්සන ම ලස්සන

බෝනික්කෙක්...



ආච්චි කියපු දේ අහපු නිසා තමයි

මේ තෑග්ග ලැබුණේ... ලුමිණි සිතුවා.

එයා ආය කවදාවත් ඉස්කෝලෙට

සෙල්ලම් බඩු අරන් ගියේ නෑ.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පිවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01